සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | ඉතිහාසය | 2 | 03. පුනරුදය |

| | |
|---|---|
| සැකසුම | එම්.ජී.එන්. නදීෂාණි<br>බප/හො/පරගොඩ කිතුලගොඩ ක.වි |



# පුනරුදය හැඳින්වීම

- පුනරුදය යන වචනයේ සරල අදහස පිබිදීම යන්නයි.

- 14 වන සියවසේ සිට 16 වන සියවස දක්වා යුරෝපයේ ශාස්ත්‍රීය, ආගමික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ගේ පුළුල් පරිවර්තනයක් සිදුවූ අතර එය ග්‍රීක රෝම ශිෂ්ටාචාර පිළිබඳ යුරෝපියන් තුළ ප්‍රබල උනන්දුවක් ඇතිවීමට හේතු විය.

- ඒ අනුව පුනරුදය යනු ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල ආභාෂය ලබමින් යුරෝපයේ ඇති වූ පුළුල් පරිවර්තනයයි.

- ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ රෝම ශිෂ්ටාචාරය බිඳ වැටීමත් සමග යුරෝපයේ එතෙක් පැවති පැරණි යුගය අවසන් විය.
- ඉන් පසු එළඹුණු ක්‍රි. ව. 500-1500 අතර කාලය යුරෝපයේ මධ්‍යතන යුගය ලෙස හඳුන්වයි.
- මෙම යුගය අවසන් කාලයේ යුරෝපීයන් තුළ පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරයන් කෙරෙහි ප්‍රබල උනන්දුවක් ඇතිවිය.
- ඒ තුළ ග්‍රීක රෝම ශිෂ්ටාචාරවලට අයත් පොත පත හැදෑරීමට, ග්‍රීක හා ලතින් භාෂා අධ්‍යයනයටත් යුරෝපීයයන් යොමු විය.
- මෙලෙස ග්‍රීක රෝම ශිෂ්ටාචාර පිළිබඳ කරුණු හැදෑරීම මෙන්ම ඒවායේ පැවති සංස්කෘතිකාංග නැවත යුරෝපයේ ජනප්‍රිය වීම ආරම්භ වීමත් පුනරුද සමයේ විශේෂයෙන් කැපී පෙනෙන ලත්ෂණයකි.
- මෙම යළි පන ලැබීම යුරෝපා ඉතිහාසයේ ඇති වූ පුනරුදයක් හෙවත් යළි පිබිදමකි.
- **මෙම පුනරුදය ආරම්භ වූයේ ඉතාලියෙනි.**

# පුනරුදය ඇතිවීමට හේතු

## 1. <u>කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි බලයට යටත් වීම</u>

- 1453 වර්ෂයේදී ඉස්ලාම් භක්තිතයින් වූ තුර්කීන් කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම නිසා යුරෝපා වෙළදාමට ප්‍රබල පහරක් වැදුණි.
- මෙම අවධිය වනවිට යුරෝපයේ ක්‍රිස්තු භක්තිකයින් හා බැහැරින් සිටි ඉස්ලාම් භක්තිකයින් අතර ගැටුමක් පැවතිණි.
- ඉස්ලාම් ආගම ඇදහූ තුර්කීන් කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම නිසා යුරෝපයේ ක්‍රිස්තියානීන්ට එය භාවිත කල නොහැකි විය.
- මේ නිසා එහි සිටි උගතුන් ග්‍රීක රෝම පොත්පත් රැගෙන තම රටවල් කරා පලා ගිය අතර එකී භාෂා හැදෑරීමට අවශ්‍ය ග්‍රීක් හා ලතින් භාෂා අදාළ නගරවල ප්‍රචලිත කිරීමට ද ක්‍රියා කළහ.

# පුනරුදය ඇතිවීමට හේතු

## 2. <u>වෙළඳාම දියුණු වීම හා ධනවතුන් පිරිසක් බිහි වීම.</u>

- ක්‍රි.ව. 12 වන සියවසේ සිට යුරෝපයේ වෙළඳාම සම්බන්ධයෙන් ඇති වූ දියුණුව පුනරුදයට බලපෑ දිගුකාලීන හේතුවකි.
- පෙරදිග හා අපරදිග රටවල් අතර පැවති වෙළඳාම නිසා ඉතාලියේ ප්ලෝරන්ස්, ජිනෝවා, වැනීසිය වැනි දියුණු වෙළඳ නගර බිහිව පැවතිණි.
- එම නගරවල සිටි ධනවතුන්ට කලාත්මක අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට විවේකය මෙන්ම අනුග්‍රහය දැක්වීමට ධනය ද තිබිණි.

**නිදසුන්: ප්ලෝරන්ස් නගරයේ සිටි මෙඩිසි පවුල**

# පුනරුදය ඇතිවීමට හේතු


## 3. බුද්ධි ප්‍රබෝධය

- රෝමය බිඳ වැටීමෙන් පසු ගත වූ කාලය තුළ යුරෝපයේ ක්‍රිස්තු සභාව හා පූජකවරුන් කේන්ද්‍ර කොටගත් අධ්‍යාපන ක්‍රමයක් පැවතිණි.
- දේවධර්මය, දර්ශනය වැනි විෂයන් කිහිපයක් පමණක් ඒවායේ ඉගැන්වීය.
- 12 වන සියවසෙන් පසු යුරෝපයේ විශ්ව විද්‍යාල ආරම්භ විය.


# පුනරුදය ඇතිවීමට හේතු

| මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල | |
|---|---|
| රට | විශ්වවිද්‍යාල |
| ඉතාලිය | බොලොඤ්ඤා, පාදුවා |
| ප්‍රංශය | පැරිස් |
| එංගලන්තය | ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් |

- මෙම විශ්වවිද්‍යාලවල පැරණි සාහිත්‍ය, ඉතිහාසය, නාට්‍ය වැනි විෂයන් රාශියක් ඉගැන්වූ නිසා නව උගතුන් බිහිවිය.
- විශ්වවිද්‍යාල ආශ්‍රිතව අධ්‍යයන සදහා අවශ්‍ය ග්‍රන්ථ පිටපත් සීමිත වීම නිසා දැනුම ව්‍යාප්ත වීමේ ගැටළු මතු විය.
- පුනරුද සමයේ ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම හේතුවෙන් එක් පොතකින් පිටපත් දහස් ගණනක් කෙටි කලකින් නිපදවීමට හැකිවීම දැනුම ව්‍යාප්ත වීමේ විප්ලවයට හේතු විය.



ජොහැන්නස් ගුටෙන්බර්ගේ මුද්‍රණ යන්ත්‍රය



# පුනරුදය ඇතිවීම

## ❖නව උගතුන් බිහිවීම

- පුනරුදයට පෙර යුරෝපා රටවල භාවිත වූයේ එක් එක් රටවලට හෝ ප්‍රදේශයන්ට සීමා වූ භාෂාවන් වේ.
- පුනරුද සමයේ ග්‍රීක හා ලතින් භාෂාවන් ඉගෙනීම විලාසිතාවක් වූ අතර ඒ තුළින් එම භාෂා සේම සාහිත්‍ය ඉගෙනීම ද පුළුල් විය.
- මේ නිසාවෙන් නව උගතුන් රැසක් බිහිවිය.

# පුනරුදය ඇතිවීම

| පුනරුද සමයේ බිහි වූ ගත්කතුවරු | |
|---|---|
| ගත්කතුවරයා | රට |
| ඩාන්ටේ | ඉතාලිය |
| විලියම් ශේක්ෂ්පියර් | එංගලන්තය |
| ඉරාස්මස් | ප්‍රංශය |



## ❖ මානවවාදය ඉස්මතුවීම

- ✓ පුනරුද සමයට පෙර සියල්ලටම වඩා දෙවියන් උතුම්ය යන සංකල්පය පැවතිණි.
- ✓ එය දේවවරම් වාදය ලෙස හඳුන්වයි.
- ✓ එහෙත් පුනරුද සමයේ දී මානවයාගේ කටයුතු පිළිබඳ වැඩි වැඩියෙන් හැදෑරීම් සිදුකළ අතර එමගින් මානව වාදය යන සංකල්පය ඉස්මතු විය.
- ✓ ඒ තුළ මානවයා මෙතෙක් පැමිණි ගමන්මග මිනිසාගේ කලාත්මක හැකියාව ආදිය කෙරෙහි අවධානය යොමු කෙරුණු අතර ඉතිහාසය , කලාව වැනි නව විෂය රැසක් බිහි විය.

# කලා ශිල්ප

| පුනරුද සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවය | පුනරුද සමයේ කලා ශිල්ප |
| --- | --- |
| ආගමික මුහුණුවරක් ගැනීම. | ලෞකිකත්වයට මූලිකත්වය ලබා දීම. |
| ක්‍රිස්තුස් වහන්සේගේ, කන්‍යා මරියතුමිය හෝ ජනප්‍රිය සාන්තුවරයන් නිර්මාණ වලට වස්තු විෂය වීම. | රජවරුන්, බිසෝවරුන්, කුමර කුමරියන්, ධනවත් පවුල්වල අයද වස්තු විෂය කර ගැනීම. |
| ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වීම සහ ඔවුන්ගේ නිර්මාණ එම ශ්‍රේණියේ නමින් හැඳින්වීම. | නිර්මාණය කතෘගේ නමින්ම එළිදැක්වීම. |
| පල්ලිය පමණක් කලා නිර්මාණලට අනුග්‍රහය දැක්වීම. | විවිධ ධනවතුන් අනුග්‍රහය දැක්වීම. |
| ආගමික භක්තියක් ජනිත කිරීම  මූලික අරමුණ වීම. | රස වින්දනය ඇති කිරීම මූලික පරමාර්ථය වීම. |
| ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොවීම. | ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරීම. |

# චිත්‍ර කලාව

- මෙය පුනරුද සමයේ ප්‍රබල වෙනසකට ලක්විය.
- ඉතාලියේ ප්ලෝරන්ස් නගරය නව චිත්‍ර කලාවක් බිහි කල මධ්‍යස්ථානය විය.
- ලෞකිකත්වයට මුල් තැන හිමි විය.

## පුනරුද සමයේ චිත්‍ර ශිල්පීන්

### 1. ලියනාඩෝ ඩාවින්චි


- ඉතාලි ජාතිකයෙකි.
- මොහු චිත්‍ර ශිල්පියෙකු, ගෘහනිර්මාණ ශිල්පියෙකු, ඉංජිනේරුවෙකු, කවියෙකු හා සංගීතඥයෙකු ද විය.

# චිත්‍ර කලාව

මොනාලිසා



අන්තිම රාත්‍රී භෝජනය



# 2. මයිකල් ආන්ජිලෝ

- මොහු විශිෂ්ට චිත්‍ර ශිල්පියෙකි.
- එමෙන්ම, ඔහු මූර්ති ශිල්පියෙකු මෙන් ම ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස ද ප්‍රකටය.

මයිකල් ආන්ජිලෝ



සිස්ටයින් දෙව්මැදුරේ සිතියම



පියෙටා රුව





ඩේවිඩ්ගේ ප්‍රතිමාව

# මූර්ති කලාව


- පුනරුද සමයේ කිරිගරුඬින් ප්‍රතිමා නෙළීම කැපීපෙනෙන ලක්ෂණයකි.
- මයිකල් ආන්ජිලෝ පුනරුද සමයේ සිටි අග්‍රගණ්‍ය මූර්ති ශිල්පියෙකි.

  නිදසුන් - පියෙටා ප්‍රතිමාව, ඬේවිඞ්ගේ ප්‍රතිමාව, මෝසෙස්ගේ ප්‍රතිමාව

- ඬොනෙටෙලෝ ද පුනරුද සමයේ ප්‍රතිමා ශිල්පීන් අතර කැපී පෙනේ.

  නිදසුන් - ප්ලෝරන්ස් නගරයේ නිර්මාණය කර ඇති ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව





# ගෘහ නිර්මාණ

- පුනරුද සමයේ ගොඩනැගිලි ඉදි කිරීමේ දී පැරණි රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ යම් යම් ලක්ෂණ අනුකරණය කිරීම කැපී පෙනේ.
- රෝම ගොඩනැගිලි තැනීමේ දී භාවිත කළ වටකුරු ආරුක්කු, උස් කුලුණු, අර්ධ ගෝලාකාර ශිඛර සහිත ගොඩනැගිලි ඉදි කිරීම මෙකල දැකගත හැක.


නිදසුන් - රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුර



# ගෘහ නිර්මාණ

## රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුර

- මයිකල් ආන්ජිලෝ හා දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූ රෆායල්ගේ නිර්මාණ රැසක් මෙහිදී දැකගත හැක.






# විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත

## නිකලස් කොපර්නිකස්

- පෘථිවිය ගෝලාකාර බවත් පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තූන් සූර්යා වටා ගමන් කරන බවත් මොහු සොයා ගන්නා ලදී.
- ඒ අනුව පෘථිවිය පැතලි වස්තුවක් යන මතය නිශ්ප්‍රභා විය.
- මොහුගේ සොයාගැනීම් තාරකා හා ග්‍රහලෝක පිළිබඳ විද්‍යානුකූල අධ්‍යයනයකට මං විවර කළේය.
- තාරකා විද්‍යාවට මොහුගෙන් සිදු වූ සේවාව නිසා තාරකා විද්‍යාවේ පියා ලෙස මොහු හඳුන්වයි.



# ජොහැන්නස් කෙප්ලර්

❖ කොපර්නිකස් ඉදිරිපත් කළ අදහස් කෙප්ලර් විසින් තව දුරටත් ඉදිරියට ගෙන යන ලදී.

❖ පෘථිවිය ඇතුළු අනෙක් ග්‍රහ වස්තූන් සූර්යා වටා වෘත්තාකාරව ගමන් ගන්නා බව මෙතෙක් පැවති මතයයි.

❖ එහෙත් **සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහක සියල්ල වෘත්තාකාරව නොව ඉලිප්සාකාරව ගමන් ගන්නා බව** මෙතුමා සොයා ගන්නා ලදී.




# ගැලීලියෝ ගැලලි

- විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකු වූ මොහු දුරේක්ෂය නිපදවා ආකාශ වස්තු නිරීක්ෂණය කළේය.

- එහි ප්‍රතිඵලයක් ලෙස චන්ද්‍ර ආවාට හා කඳු ,සූර්ය ලප හා බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයින් පිළිබඳ තොරතුරු රැසක් නිරීක්ෂණය කළ හැකි විය.






# වෛද්‍ය විද්‍යාවේ දියුණුව

- **විලියම් හාවේ** - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම.
- **වෛද්‍ය පැරසල්සස්** - ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීම.
- **මයිකල් සර්ටෙස්** - රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ සිරුර පුරා විසිරී යාම පිළිබඳ තොරතුරු සොයා ගත්තේය.

විලියම් හාවේ



වෛද්‍ය පැරසල්සස්



මයිකල් සර්ටෙස්



# ආගමික ප්‍රතිසංස්කරණ

- පුනරුද සමයේ ඇති වූ චින්තන විප්ලවය නිසා සෑම අංශයක් දෙසම විචාරාත්මකව බැලීමට ජනතාව පුරුදු විය.
- මේ තුළ ආගමික ඉගැන්වීම් හා ක්‍රිස්තු සභාව භුක්ති විදි අසීමිත බලය දෙස විචාරාත්මකව බලමින් පල්ලියේ බලයට එරෙහිව නැගී සිටින ලදී.
- මෙම කණ්ඩායම් ප්‍රොතෙස්තන්ත්‍රවාදීන් හෙවත් රෙපරමාදුවාදීන් ලෙස හැදින්වේ.
- පූජකයන්ගේ දූෂණවලට එරෙහිව විවේචන එල්ල කළ පුද්ගලයින් අතර **එංගලන්තයේ ජෝන් වයික්ලිෆ්, ප්‍රංශයේ ඉරාස්මස්** වේ.
- **පුනරුද සමයේ ක්‍රිස්තියානි පල්ලියට විරුද්ධව මතු වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මාටින් ලූතර්, ජෝන් කැල්වින් වැනි නායකයන්ගේ මූලිකත්වයෙන් තව දුරටත් ඉදිරියට ගෙන යන ලදී.**

# මාටින් ලූතර්

- ජර්මනියේ උපන් මොහු විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු විය.
- ඔහු පල්ලියේ ඉගැන්වීම් තුළ බයිබලයේ ඉගැන්වීම් වලට පටහැනි බොහෝ දේ ඇතිබව ප්‍රත්‍යක්ෂ කර ගත්තේය.
- මෙ කාලයේ ජර්මනියේ විටෙන්බර්ග් නුවරදී පව් සමාකිරීමෙ පත්‍ර විකිණීමෙ නිරතව සිටි පූජකයෙකු මුණගැසිණි.
- ඒ පිළිබද කම්පනයට පත් ලූතර් පියතුමා ඒ පිළිබද තම අදහස් ඇතුළත් පත්‍රිකාවක් විටෙන්බර්ග් දේවස්ථානයේ දොරේ ඇළවීය.

# මාටින් ලූතර්

- එහි ප්‍රතිඵලයක් ලෙස ලූතර් කතෝලික සභාවෙන් නෙරපීය.
- මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීමත් සමග මොහුගේ අදහස් ජර්මනියේ මෙන්ම මුළු යුරෝපයේම ව්‍යාප්ත විය.
- මොවුන්ගේ මෙම අදහස් ඇතුළත් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හැදින්වූයේ **රෙපරමාදු හෙවත් ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය** ලෙසයි.



සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | ඉතිහාසය | 2 | 03. පුනරුදය - ඇගයීම |

සැකසුම: එම්.ජී.එන්. නදීෂාණි
බප/හො/පරගොඩ කිතුලගොඩ ක.වි

1. පුනරුදය යන්න කෙටියෙන් හඳුන්වන්න.
2. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් ලියන්න.
3. මධ්‍යතන යුගය අවසානයේ පහත සඳහන් රටවල බිහි වූ විශ්වවිද්‍යාලය බැගින් ලියා දක්වන්න.
   i. ඉතාලිය -
   ii. ප්‍රංශය -
   iii. එංගලන්තය -
4. මධ්‍යතන යුගයේ යුරෝපයේ බිහිවූ විශ්වවිද්‍යාල බුද්ධි ප්‍රබෝධයට දායක වූයේ කෙසේද?
5. පහත සඳහන් රටවල පුනරුද සමයේ බිහිවූ ගත්කතුවරයෙකු බැගින් ඉදිරියෙන් ලියන්න.
   i. ඉතාලිය -
   ii. ප්‍රංශය -
   iii. එංගලන්තය -
6. පුනරුද සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවය හා පුනරුද සමයේ කලා ශිල්ප අතර වෙනස්කම් තුන බැගින් සන්සන්දනාත්මකව වගුගත කරන්න.
7. පුනරුද සමයේ කලා ශිල්ප ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කලා ශිල්පය | නිර්මාණයේ නම | නිර්මාණ ශිල්පියාගේ නම |
|---|---|---|
| චිත්‍ර කලාව | | |
| ප්‍රතිමා කලාව | | |
| ගෘහ නිර්මාණ ශිල්පය | | |

8. පහත සඳහන් පුද්ගලයින් විසින් පුනරුද සමයේ සොයාගන්නා ලද නව සොයාගැනීම් කවරේද යන්න ලියා දක්වන්න.

   i. නිකලස් කොපර්නිකස් -
   ii. ජොහැන්නස් කෙප්ලර් -
   iii. ගැලීලියෝ ගැලිලි -
   iv. විලියම් හාවේ -
   v. වෛද්‍ය පැරසල්සස් -
   vi. මයිකල් සර්වෙස් -

9. පුනරුද සමයේ සිදුවූ ආගමික වෙනස කෙබඳු දැයි කෙටියෙන් විස්තර කරන්න.

10. හිස්තැන් පුරවන්න.

   i. ක්‍රි.ව. 500- 1500 ත් අතර කාලය යුරෝපයේ .................................. යුගය ලෙස හඳුන්වයි.
   ii. ................................ වර්ෂයේ දී තුර්කි ජාතිකයින් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගන්නා ලදී.
   iii. ෆ්ලෝරන්ස් නගගරයේ විසූ .................................. පවුල එහි කලාත්මක කටයුතුවලට අතහිත දුන් ධනවත් පවුලකි.
   iv. ........................................ විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලදී.
   v. ලෝක ප්‍රසිද්ධ මොනාලිසා චිත්‍රය අඳින ලද්දේ .................................................. විසිනි.
   vi. ............................................ තාරකා විද්‍යාවේ පියා ලෙස ද හඳුන්වයි.
   vii. මධ්‍යතන යුගය අවසාන භාගයේ පූජකයින්ගේ දූෂණවලට එරෙහිව එංගලන්තයේ ..................... හා ප්‍රංශයේ ................................ යන පුද්ගලයින් විවේචන එල්ල කළේය.
   viii. පල්ලියේ බලයට එරෙහිව නැගීසිටි ජන කණ්ඩායම් රෙපරමාදුවාදීන් හෙවත් .................................... ලෙසද හැඳින්වේ.

**සවියෙන් පෙරට අපි එකට**
***e-* ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **8** | **ඉතිහාසය** | **2** | **03. පුනරුදය - පිළිතුරු** |

**සැකසුම: එම්.ජී.එන්. නදීෂාණි**
**බප/හො/පරගොඩ කිතුලගොඩ ක.වි**

1. පුනරුදය යනු ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවල ආභාෂය ලබමින් යුරෝපයේ ඇති වූ පුළුල් පරිවර්තනයයි.
2. * කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි බලයට යටත් වීම
   * වෙළඳාම දියුණු වීම හා ධනවතුන් පිරිසක් බිහිවීම
   * බුද්ධි ප්‍රබෝධය
3.
   I. බොලොඤ්ඤා/ පාදුවා
   II. පැරිස්
   III. ඔක්ස්ෆර්ඩ්/කේම්බ්‍රිජ්
4. පුනරුද සමයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාලයන්හි පැරණි සාහිත්‍ය, ඉතිහාසය, නාට්‍ය වැනි විෂයන් ඉගැන්වීම නිසා නව උගතුන් බිහිවිය. එමෙන්ම විශ්ව විද්‍යාලවල පර්යේෂණ කටයුතු වලදී ග්‍රීක රෝම පොත්පත් යොදා ගැනුණු අතර පැරණි සාහිත්‍ය අධ්‍යයනයට විශේෂ තැනක් හිමිවීම නිසා මේ යටතේ පැවති ග්‍රීක රෝම විද්‍යාත්මත හා කලාත්මක දැනුමේ නව පිබිදීමක් ඇතිවිය.
5.
   I. ඩාන්ටේ
   II. ඉරාස්මස්
   III. විලියම් ශේක්ෂ්පියර්

6.

| පුනරුද සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවය | පුනරුද සමයේ කලා ශිල්ප |
|---|---|
| ආගමික මුහුණුවරක් ගැනීම | ලෞකිකත්වයට මූලිකත්වය ලබා දීම. |
| ක්‍රිස්තුස් වහන්සේගේ, කන්‍යා මරියතුමිය හෝ ජනප්‍රිය සාන්තුවරයන් නිර්මාණ වලට වස්තු විෂය වීම. | රජවරුන්, බිසෝවරුන්, කුමර කුමරියන්, ධනවත් පවුල්වල අයද වස්තු විෂය කර ගැනීම. |
| ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වීම සහ ඔවුන්ගේ නිර්මාණ එම ශ්‍රේණියේ නමින් හැඳින්වීම. | නිර්මාණය කතෘගේ නමින්ම එළිදැක්වීම |

7.

| කලා ශිල්පය | නිර්මාණයේ නම | නිර්මාණ ශිල්පියාගේ නම |
|---|---|---|
| චිත්‍ර කලාව | මොනාලිසා, ක්‍රිස්තුන්වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය | ලියනාඩෝ ඩාවින්චි |
| | මයිකල් ආන්ජිලෝ | සින්ස්ටයින් දේව මන්දිරයේ සිවිලිමේ ඇඳ ඇති සිතුවම |
| ප්‍රතිමා කලාව | මයිකල් ආන්ජිලෝ | පියෙට්‍රා ප්‍රතිමාව, ඩේවිඩ්ගේ ප්‍රතිමාව, මෝසෙස්ගේ ප්‍රතිමාව |
| | ඩොනටෙලෝ | ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව |
| ගෘහ නිර්මාණ ශිල්පය | මයිකල් ආන්ජිලෝ, රෆායල් | ශාන්ත පීතර දෙව් මැදුර |

8.

I. පෘථිවිය ගෝලාකාර බව හා පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තූන් සූර්යාවටා ගමන් ගන්නා බවත් සොයා ගන්නා ලදී.

II. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව

III. දුරදක්නය නිපදවීම

IV. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම.

V. ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීම.

VI. රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ සිරුර පුරා විසිරී යාම පිළිබඳ තොරතුරු සොයා ගත්තේය.

9. * පුනරුද සමයේ ඇති වූ චින්තන විප්ලවය නිසා සෑම අංශයක් දෙසම විචාරාත්මකව බැලීමට ජනතාව පුරුදු විය.

* මේ තුළ ආගමික ඉගැන්වීම් හා ක්‍රිස්තු සභාව භුක්තිවිදි අසීමිත බලය දෙස විචාරාත්මකව බලමින් පල්ලියේ බලයට එරෙහිව නැගී සිටින ලදී.

* මෙම කණ්ඩායම් ප්‍රොතෙස්තන්තවාදීන් හෙවත් රෙපරමාදුවාදීන් ලෙස හැදින්වේ.

* පූජකයන්ගේ දූෂණවලට එරෙහිව විවේචන එල්ල කළ පුද්ගලයින් අතර එංගලන්තයේ ජෝන් වයික්ලිෆ්, ප්‍රංශයේ ඉරාස්මස් වේ.

* පුනරුද සමයේ ක්‍රිස්තියානි පල්ලියට විරුද්ධව මතු වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මාටින් ලූතර් , ජෝන් කැල්වින් වැනි නායකයන්ගේ මූලිකත්වයෙන් තව දුරටත් ඉදිරියට ගෙන යන ලදී.

10.

I. මධ්‍යතන යුගය

II. ක්‍රි.ව. 1453

III. මෙඩිසි

IV. ජොහැන්නස් ගුටෙන්බර්ග්

V. ලියනාඩෝ ඩාවින්චි

VI. නිකලස් කොපර්නිකස්

VII. ජෝන් වයික්ලිෆ් / ඉරාස්මස්

VIII. ප්‍රොතෙස්තන්තවාදීන් හෙවත් රෙපරමාදුවාදීන්